# නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සහකාර අධ්‍යක්ෂ (නීති) තනතුර (MM 1-1) සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් බාහිර හා අභ්‍යන්තර වශයෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :**

**සෑම අපේක්ෂකයෙක්ම,**

(අ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

(ආ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

(ඇ) විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**බාහිර අයදුම්කරුවන් සඳහා අධ්‍යාපන සුදුසුකම් :**

(අ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් නීතිවේදී උපාධිය

සමග

(ආ) නීතිඥවරයෙකු වශයෙන් සහ සිංහල සහ ඉංග්‍රීසි බලපත් සහිතව නොතාරිස් වෘත්තියේ වසර 02 ක සේවා පළපුරුද්ද

සමග

(ඇ) උපාධිය ලබා ගැනීමෙන් පසු සහ වෘත්තීය සුදුසුකම් ලබා ගැනීමෙන් රජයේ හෝ රාජ්‍ය ආයතනයක හෝ රජය පිළිගත් පෞද්ගලික ආයතනයක නීති කටයුතු හා නොතාරිස් කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 02 ක සේවා පළපුරුද්දක් තිබීම

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් :**

(අ) නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කනිෂ්ඨ කළමනාකරණ සේවා ශ්‍රේණියේ (JM 1-1) I ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ වසර 05 ක සතුටුදායක සේවා කාලයක් තිබීම.

**පොදු කොන්දේසි :**

වැටුප් පරිමාණය : MM 1-1-2016 රු. 53,175 - 10X1,375 - 15X1,910 - රු. 95,575

වැටුප් පියවර : රු. 53,175/-

වයස් සීමාව : අවු. 25 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

වෙනත් ප්‍රතිලාභ :
- ✷ ජීවන වියදම් දීමනාව
- ✷ ආයතනයෙන් 12% ක සේ.අ.අ. (EPF) හා 3% ක සේ.භා.අ. (ETF) දායකත්වය
- ✷ රජයේ සහ ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලත් වෙනත් ප්‍රතිලාභ

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ ජීවදත්ත සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමගින් 2023.10.02 දින හෝ ඊට පෙර පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ E-mail ලිපිනයට යොමු කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය,**
**09 වන මහල,**
**සෙත්සිරිපාය, බත්තරමුල්ල.**

**දුරකථනය : 011-2871305, ෆැක්ස් : 0112865512**

**ඊමේල් :** admnusda@gmail.com